කොළඹ මහා නගර සභාව
පුරප්පාඩු දැන්වීම

කොළඹ මහා නගර සභාවේ ශ්‍රම මිල දී ගැනීමේ පදනම මත තාක්ෂණික නිලධාරීන් / සැලසුම් ශිල්පීන්ගේ සේවය ලබාගැනීම

කොළඹ මහා නගර සභාවේ නාගරික ඉංජිනේරු දෙපාර්තමේන්තුවට තාක්ෂණික නිලධාරීන් හා සැලසුම් ශිල්පීන් ශ්‍රම මිල දී ගැනීමේ පදනම මත සේවය ලබාගැනීම සඳහා මෙයින් අයදුම්පත් කැඳවනු ලැබේ.

එම අයදුම්පත් බහාලන කවරයෙහි වම්පස ඉහළ කෙළවරේ තනතුරු නාමය සඳහන් කර 2022.03.14 දිනට ප්‍රථම **නාගරික ලේකම්, කොළඹ මහා නගර සභාව, පුරහල, කොළඹ - 07** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු අතර, රට තුළ පවතින කොවිඩ් වාතාවරණය තුළ බඳවා ගැනීම කඩිනම් කිරීම පිණිස අයදුම්පත් පහත සඳහන් විද්‍යුත් තැපෑල මගින් ද යොමුකළ යුතුය.

- dircp@colombo.mc.gov.lk

01. තනතුර : තාක්ෂණික නිලධාරීන් හා සැලසුම් ශිල්පීන් ශ්‍රම මිලදී ගැනීමේ පදනම මත සේවය ලබාගැනීම.

02. වැටුප් ප්‍රමාණය : දිනකට රු. 2,200.00 බැගින්

03. කායික සුදුසුකම් : තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් තරම් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

04. වෙනත් සුදුසුකම්

(i) ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය.

(ii) බස්නාහිර පළාතේ රාජ්‍ය සේවයේ හා පළාත් රාජ්‍ය සේවයේ විශ්‍රාමලත් තාක්ෂණික නිලධාරීන් හා තාක්ෂණ නිලධාරීන් (සැලසුම් සේවය) සහ ශ්‍රී ලංකා තාක්ෂණික සේවා ව්‍යවස්ථාව අනුව III වන පන්තියට සුදුසුකම් ලබන නිලධාරීන් විය යුතුය.

(iii) මොරටුව විශ්වවිද්‍යාලය හෝ අම්පාර හාඩ් ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව හෝ

(iv) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන ඉංජිනේරු විද්‍ය ජාතික ඩිප්ලෝමාව හෝ

(v) අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු ඩිප්ලෝමාව හෝ

(vi) පිළිගත් ආයතනයක පූර්ණකාලීන එක් අවුරුදු සැලසුම් ශිල්පී පාඨමාලාව සාර්ථකව අවසන් කර තිබීම.

(vii) රැකියා ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තීය කුසලතා (NVQ) 06 මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම.

(viii) උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණ සහතික නිකුත් කරන ආයතනවලින් විමසා අදහස් ලබාගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම්වලට සියලු අතින් සමාන යැයි තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම.

(ix) විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

(x) අයදුම්පත් භාරගන්නා අවසාන දිනට අවශ්‍ය සියලුම සුදුසුකම් සපුරා තිබිය යුතුය.

(xi) නාගරික සංවර්ධන අධිකාරියේ ගොඩනැගිලි හා සැලසුම් රෙගුලාසි සම්බන්ධතා හා තොරතුරු තාක්ෂණ ක්‍රමවේද පිළිබඳ දැනුවත් බව අමතර සුදුසුකමක් වේ.

05. බඳවා ගැනීමේ ක්‍රමය : බස්නාහිර පළාතේ රාජ්‍ය සේවයේ හා පළාත් රාජ්‍ය සේවයේ විශ්‍රාමලත් තාක්ෂණික නිලධාරීන් සහ ශ්‍රී ලංකා තාක්ෂණික සේවා ව්‍යස්ථාව අනුව III වන පන්තියට සුදුසුකම් ලබන නිලධාරීන් පහත කොන්දේසිවලට යටත්ව සේවය ලබා ගනු ලැබේ.

01. **සම්මුඛ පරීක්ෂණයකින් පසු සේවා ලබාගැනීම සිදු කෙරේ.**
02. **දිනකට අවම පැය 08 ක කාලයක් සේවයේ යෙදිය යුතුය.**
03. **පූර්ණ කාලීනව රාජකාරීන්හි නියැලිය යුතුය.**
04. **සති අන්ත ඇතුළුව වැඩ කරන මාසයකට (දින 25 ට) එක් අයෙකුට රු. 55,000/- ක් බැගින් ගෙවීම් කරනු ලැබේ.**

අදාළ සේවා ලබාගැනීම සම්බන්ධයෙන් අවසාන තීරණය නාගරික කොමසාරිස් සතු වේ.

නීතිඥ රෝෂණී දිසානායක,
නාගරික කොමසාරිස්,
කොළඹ මහා නගර සභාව, පුරහල, කොළඹ 07.

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා

කොළඹ මහා නගර සභාව සඳහා ශ්‍රම මිලදී ගැනීමේ පදනම මත තාක්ෂණික නිලධාරීන් / සැලසුම් ශිල්පීන්ගේ සේවය ලබාගැනීමේ ආදර්ශ අයදුම්පත්‍රය

01. මූලකරු සමග නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) (Mr./Mrs./Ms)

02. මූලකුරු වලින් හැඳින්වෙන නම (සිංහලෙන්) : .....

03. මූලකුරු වලින් හැඳින්වෙන නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :

04. I. ස්ථිර ලිපිනය (සිංහලෙන්) : .....

II. ස්ථිර ලිපිය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :

III. තාවකාලික ලිපිනය (සිංහලෙන්) .....

05. උපත් දිනය : අවුරුද්ද ☐☐☐☐ මාසය ☐☐ දිනය ☐☐

06. විශ්‍රාමගත් දිනය : .....

07. විශ්‍රාම ගත් දිනට වයස : .....

08. ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐☐

09. දුරකථන අංක පෞද්ගලික : ..... කාර්යාලයීය : .....

10. අධ්‍යාපන සුදුසුකම් : අ.පො.ස. (සා/පෙ) විභාග අංකය : ..... වර්ෂය : .....

විෂය	සාමාර්ථය	විෂය	සාමාර්ථය

අ.පො.ස. (උ/පෙ) විභාග අංකය : ..... වර්ෂය : .....

විෂය	සාමාර්ථය

11. අවසන් වරට සේවය කළ දෙපාර්තමේන්තුව හා තනතුර : .....

12. විශ්‍රාම ගන්නා විට පැවති වැටුප් ක්‍රමය : .....

13. ශ්‍රී ලංකා තාක්ෂණ සේවා ව්‍යවස්ථාව අනුව III වන ශ්‍රේණියට අදාළ සුදුසුකම් සපුරා තිබීම.
(ලියකියවිලි මගින් සනාථ කළ යුතු වේ)

14. අමතර සුදුසුකම් : .....

ඉහතින් මා විසින් සඳහන් කරන ලද කරුණු මාගේ දැනීම හා විශ්වාසය පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කර සිටින අතර, කිසියම් තොරතුරක් අසත්‍ය බව හෝ වැරදි බව මා තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා තනතුරකට නුසුදුස්සෙකු බව බවත්, පත්කිරීමෙන් පසු අනාවරණය වුවහොත් සේවා සැපයුමෙන් පහ කළ හැකි බවත් මා දනිමි.

....

දිනය අයදුම්කරුගේ අත්සන